ඔබ අතර සිටින දුබලයින්ගෙන් හැර ඔබ උදව් කරනු ලබන්නෙහු ද, පෝෂණය කරනු ලබන්නෙහු ද?

මුස්අබ් ඉබ්නු සඃද් තුමා විසින් මෙසේ පවසන ලදී. "තමන්ට පහළින් සිටින උදවියට වඩා උසස්කමක් තමන් හට ඇති බව සඃද් (රළියල්ලාහු අන්හු) තුමා දුටුවේය. එවිට නබි
(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්රකාශ කළහ": "ඔබ අතර සිටින
දුබලයින්ගෙන් හැර ඔබ උදව් කරනු ලබන්නෙහු ද, පෝෂණය කරනු ලබන්නෙහු ද?"
[صحيح] [رواه البخاري]

සඃද් ඉබ්නු අබී වක්කාස් (රළියල්ලාහු අන්හු) තුමා ඔහුුගේ වීරත්වය හා එවැනි කරුණු හේතුකොට ගෙන දුර්වල අයට වඩා තමන්ට උසස්කමක් ඇති බව සිතුවේය. එවිට (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ. "දුබලයින්ගේ ප්රාර්ථනාවන්, ඔවුන්ගේ සලාතයන් හා ඔවුන්ගේ අවංකකමින් තොරව ඔබ උදව් ලබන්නෙහු ද? පෝෂණය කරනු ලබන්නෙහු ද? ඔවුන්ගෙන් බහුතරයක් දෙනා ප්රාර්ථනාවෙහි දැඩි අවංකභාවයකින් යුත්තෝ වෙති. මෙලොව අලංකාරයෙන්ගෙන් බැදී සිටීමෙන් ඔවුන්ගේ හදවත් හිස් ව ඇති බැවින් නැමදුමෙහි වඩාත් භක්තිමත් වූවෝ වෙති."

http://sunnah.global/hadeeth/si/show/3367